# කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය- 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1. 2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමග හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඊ.ඩබ්ලිව්. ගුණතිලක අරමුදලෙ ආයෝජනය සහ වෙනත් ආයෝජන 03 කට අදාළව 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.71,170 ක් ගිණුම් ගත කර නොතිබුණි.

#### 1.2.3 නීති රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය<br><br>XX වන ඡේදයේ 3(1) වගන්තිය සහ X වන පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා රු.8,425,286 ක වැටුප් හා දීමනා ගෙවා ඇතත්, ආයතන සංග්‍රහය ප්‍රකාරව පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා සහ නිවාඩු සනාථ කරගැනීම සඳහා අදාළ පොත් පත් ලේඛන නඩත්තු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ.104 (2) | 2012 වර්ෂයේදී සිදු වී තිබුණු වාහන අනතුරකට අදාළ මූලික පරීක්ෂණ වාර්තා 2013 අගෝස්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 371 | 2012 වර්ෂයෙ නිකුත් කර තිබුණු රු.81,627 ක් වු අත්තිකාරම් 05 ක් 2013 ජුනි 06 දින වන විටත් පියවා නොතිබුණි. |
| (iii) මු.රෙ. 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2012 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.26,332,811 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහනයක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 9,209,969 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,633,488 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 6,500,000 ක ප්‍රදාන හේතු කොටගෙන එම ඌනතාවය රු.2,709,969 ක දක්වා අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.7,314,146 ක ප්‍රදාන හේතුකොට ගෙන එම වර්ෂයේ ඌනතාවය රු.680,658 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,390,627 ක පිරිහීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ

වැටුප් හා දීමනා රු. 2,995,822 කින් වැඩිවීම සහ ගිවිසුම් ගත සේවා වියදම් රු. 1,161,298 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණ.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

අධ්‍යයන වර්ෂ 03 කට අදාළව ආයතනය විසින් පවත්වන ලද එක් අවුරුදු පාඨමාලා 07 ක සාරාංශ ගත තොරතුරු පහත පරිදි විය.

| අධ්‍යයන වර්ෂය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | | | සියයට |
| 2009/ 2010 | 404 | 389 | 357 | 32 | 8.23 |
| 2010/ 2011 | 469 | 408 | 336 | 72 | 17.65 |
| 2011/ 2012 | 464 | 393 | 311 | 82 | 20.87 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍ය ලියාපදිංචිය

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියේ සැලකිය යුතු විචලනයක් පෙන්නුම් නොකළද , පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල ) හා බෞද්ධ ආයුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල) සඳහා ශිෂ්‍ය ලයාපදිංචියේ පිළිවෙලින් සියයට 33 ක හා සියයට 59 ක අඩුවීමක් තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ආයතනය එක් අවරුද පාඨමාලා 07 ක් පවත්වා තිබූ අතර, ශිෂ්‍යයන්ගේ වැඩි දායකත්වයක් බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි (සිංහල ) හා බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි (ඉංග්‍රීසි) පාඨමාලාවට වූ අතර, එම පාඨමාලා දෙකෙහි ශිෂ්‍ය ලියාපදිංචිය සමාලෝචිත වර්ෂයේ මුළු ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 80 ක් විය.

(iii) ආයතනය විසින් බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලා 02 ක් පවත්වන අතර එයින් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට

7.2 කින් වැඩිවී තිබුණද , සිංහල පාඨමාලාව සඳහාවූ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 10.5 කින් අඩුවී තිබුණි.

(ආ) <u>විභාගවලට පෙනී සිටීම හා විභාග ප්‍රතිඵල</u>

(i) 2012 වර්ෂයේ ලියාපදිංචි සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 464 ක් වුව ද , විභාග වලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 393 ක් පමණක් විය. ඒ අනුව පෙනී නොසිටි සංඛ්‍යාව 71 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල විභාග වලට පෙනී සිටි 393 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 311 ක් වූයෙන් එහි ප්‍රතිශතය සියයට 79 ක් විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පර්යේෂණ කාර්යයන් සඳහා 1984 වර්ෂයේ ආරම්භ කර තිබුණු ඊ.ඩබ්ලිව් ගුණතිලක අරමුදල, කිසිදු පර්යේෂණ කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණ අතර 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ වටිනාකම රු.206,166 ක් විය.

(ආ) 1991 වර්ෂයේ දී ලැබී තිබුණු රු.133,149 ක් වූ විදේශ ශිෂ්‍යත්ව ආධාර, ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි වටිනාකම රු.700,394 ක් විය. කෙසේ වෙතත් අරමුණුගත කාර්යය වූ විදේශ ශිෂ්‍යත්ව ආධාර ප්‍රදානය සඳහා මෙම මුදල් උපයෝජනය කර නොතිබුණි.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට වූ ආයතනයේ කාර්යය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| **අධ්‍යයන අංශය** | | | |
| මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 04 | 04 | - |
| පුස්තකාලයාධිපති / සහකාර පුස්තකාලයාධිපති හා විද්‍යාත්මක සහකාර | 04 | 03 | 01 |
| **අනධ්‍යයන අංශය** | | | |
| විධායක | 05 | 05 | - |

| | | | |
|---|---|---|---|
| ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | 15 | 15 | - |
| කණිෂ්ඨ | 08 | 07 | 01 |
| | 36 | 34 | 02 |

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

මහාචාර්ය පුරප්පාඩු දෙකක් වෙනුවට ජ්‍යෝෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙක් බඳවා ගෙන තිබුණි.

### 3.4 සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

සේවක පාර්තෝෂික සඳහා 2012 දෙසැම්බර් 31 වන දිනට රු.4,504,383 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර අරමුදලක් ගොඩනැගමට හා එම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 වාහන පාලනය

**කුලී පදනම මත වාහන ලබාගැනීම.**

2004 අගෝස්තු 31 දිනැති අංක 353/(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, රු.40,000 සීමාවකට යටත්වූ මාසික කුලියකට පමණක් වාහන කුලියට ගත හැකි වුවද, එම චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කි.මී. 1 ට රු. 36 බැගින් ගෙවීමේ පදනමට 2012 ජනවාරි 05 දින සිට 2012 අප්‍රේල් 05 දින දක්වා කාලපරිච්ජේදයට වාහනයක් ලබාගෙන තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව, යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මගින් කුලී රථයේ ඉන්ධන දහනය පරීක්ෂා කර කි.මී. 1 ට රු. 41 ක බැගින් ගෙවීමට නිර්දේශ කිරීම හේතුවෙන් රු. 24,065 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

### 3.6 හඳුනා ගනනා ලද පාඩු

2012 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව, පුස්තකාලය ආරම්භ කළ දින සිට 2012 දෙසැම්බර් 31 දක්වා අස්ථාන ගත වී ඇති පොත් 122 ක වටිනාකම රු.33,211 ක් විය.

### 3.7 සෙමෙන් චලනය වන ශේෂ

2012 වර්ෂය ආරම්භයේදී ප්‍රකාශන 15 ක පොත් 4,462 කන් 2012 දෙසැම්බර් 14 දින වන විටත් අලෙවි වී තිබුණේ පොත් 23 ක් වන අතර එදිනට පොත් 4,438 ක තොගයක් පැවතුණි.

## 4 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාර සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්ම ඉටුකළ යුතු කාල පරාසය, වගකීම් පැවරීම සහ මූල්‍යනය පිළිබඳ විස්තර දැක්වෙන ලෙස නිශ්චිත ආකෘතියකට අනුව පිළියෙල කර නොතිබුණි.

(ආ) ආයතනයේ ක්‍රියාකාර සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ ක්‍රියාකාරකම් 05 ක් වූ නමුත් එයින් එක් කියාකාරකමක් ඉටුකර ගැනීමට නොහැකිවී තිබූ අතර අනෙකුත් ක්‍රියාකාරකම්වල සියයට 50 ක ප්‍රගතියක් විය.

4.2 <u>අයවැය ලෙඛනමය පාලනය</u>

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 120 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

4.3 <u>නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ</u>

<u>පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයට භූමිභාගයක් ලබා ගැනීම</u>

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය සඳහා ඉඩමක් මිලදී ගැනීමට 1996 වර්ෂයේදී ජාත්‍යන්තර බෞද්ධ පදනම විසින් ලබාදී තිබුණු රු.5,031,984 ක් ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කර ඊට සමාන මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. නමුත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ,කුලී පදනම මත ලබාගෙන තිබුණු ගොඩනැගිල්ලක ආයතනය පවත්වා ගෙන යනු ලබන අතර 2012 වර්ෂය සඳහා පමණක් ඒ වෙනුවෙන් ගෙවා තිබුණු කුලිය රු.4,695,000 ක් විය.

5. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) විවිධ අත්තිකාරම්
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) පුස්තකාල පරිපාලනය
(ඉ) පර්යේෂණ ආධාර
(ඊ) විභාග පරිපාලනය